# 2020 හා 2021 වර්ෂවල දී සිසු ඉගෙනුම් අවස්ථා අහිමිවීම ආවරණය සඳහා වන විශේෂ විෂය නිර්දේශය

# 8 ශ්‍රේණිය ගණිතය

## (2021 -2022 වර්ෂවල දී ක්‍රියාත්මක කිරීම සඳහා)

ගණිත දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.lk

# හැඳින්වීම

කොරෝනා වයිරස් රෝගය (COVID – 190) වසංගතය උත්සන්න වන විට රටවල් 180 කට අධික සංඛ්‍යාවක, සිසුන් බිලියන 1.6ක් පමණ දීර්ඝ කාලයක් පාසල් අධ්‍යාපනයෙන් බැහැරව සිටිය හ. ඉගෙනීමේ ක්‍රමය මාර්ගගත ක්‍රමය වෙත මාරු වන විට දුප්පත් දරුවන් අධ්‍යයන කටයුතුවල දී වඩා පසුගාමී වීමේ අවදානම වැඩි වී තිබේ. විශේෂයෙන් නිසි මැදිහත් වීමක් ක්‍රියාත්මක නොකළහොත් මෙම බාධාව දිගු කාලීන බලපෑම් ඇති කළ හැකි ය.

ශ්‍රී ලංකාවේ දුරස්ථ අධ්‍යාපනය ලබා දීමේ ප්‍රවේශය සහ ගුණාත්මකභාවය අතින් බොහෝ අඩුපාඩු පෙන්නුම් කර ඇති අතර ස්මාර්ට් ජංගම දුරකතනයක් හෝ පරිගණකයක් හිමි වූයේ පාසල් වයසේ දරුවන් සිටින ශ්‍රී ලාංකික පවුල්වලින් 48%ක් පමණක් බවත් 2019 දී අන්තර්ජාල සම්බන්ධතා පැවතීම 34%ක් පමණක් බවත් අධ්‍යයනයකින් හෙළිවී ඇත. එනිසා, ඊ-ඉගෙනීමෙන් සියලු ම නිවෙස්වලින් හරි අඩකටවත් ප්‍රයෝජන ගත නොහැකි වී ඇත. 2020 දී ගුරුවරුන් අතර සිදු කරන ලද සමීක්ෂණයකින් හෙළි වී ඇත්තේ සිසුන්ගෙන් 45%ක් පමණ මාර්ගගතව සම්බන්ධ වී ඇති නමුත් යම්තාක් දුරකට හෝ පන්ති කාමර අත්දැකීමක් ලබා දිය හැකි සූම් (Zoom) සහ මයික්‍රොසොෆ්ට් කණ්ඩායම් (Microsoft Teams) වැනි උසස් ප්‍රවේශ ක්‍රමවේද භාවිත කළේ 4%ක් පමණක් බවයි. ඉතිරි 41% ට (WhatsApp) සහ (Viber) වැනි සමාජ මාධ්‍ය හරහා පාඩම් සටහන් විශාල ප්‍රමාණයක් ලබා දී ඇත. මෙම ක්‍රමය හේතුවෙන් ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය ශක්තිමත් වී ඇත අතර එය යහපත් ප්‍රවනතාවක් නොවේ.

2020 මාර්තු මස මුලික වසා දැමීමෙන් පසු මාස 16 කටත් වැඩි කාලයක් අක්‍රියව පැවති සිසු අධ්‍යාපනය බොහෝ දුරකට හෝ සමනයකට පත්වූයේ ජාතික අධ්‍යාපන ආයතනය සමග එක්ව අධ්‍යාපන අමාත්‍යාංශය ආරම්භ කළ මාර්ගගත සහ ගුරු ගෙදර වැනි රූපවාහිනී විකාශන මගින් හා පළාත් මට්ටමින් සිදු කරන ලද විවිධ උපායමාර්ගික වැඩසටහන් හේතුවෙනි.

කෙසේ වෙතත්, සිසුන් සමග අන්තර් ක්‍රියාකාරිත්වයක් නොමැති වීම සහ පසු විපරම් කිරීමේ යාන්ත්‍රණ නොමැතිකම නිසා දුර්වල සිසුන් අතහැර දැමීමේ අවදානම, ශිෂ්‍යයින් සහ දෙමාපියන්ට වැඩසටහන් පිළිබඳ දුර්වල තොරතුරු සන්නිවේදනය, දුප්පත්කම, තාක්ෂණික දැනුමක් නොමැතිකම වැනි දේ නිසා දරුවන් ශ්‍රමයට සම්බන්ධ කර ගැනීම හෝ අධ්‍යාපනයට වඩා විනෝදාස්වාදයට ප්‍රමුඛත්වය දීම නිසා අධ්‍යාපනය සඳහා උනන්දුවක් නොදැක් වීම ආදී විවිධ කරුණු හේතුවෙන් අධ්‍යාපනික රූපවාහිනී වැඩසටහනක් නැරඹූ පිරිස ද සාධනීය මට්ටමක නොපවතී.

දුරස්ථ අධ්‍යාපනය මඟින් ඉගැන්වීමේ හා ඉගෙනීමේ නව හා වඩාත් ඵලදායී ක්‍රම නිර්මාණය කිරීමට ද අවස්ථාව සැලසී ඇති අතර විෂය අන්තර්ගතය ලබා දීම වෙනුවට ඉගෙනීමට පහසුකම් සැලසීමට සහ සහාය වීමට හැකි ඵලදායී ගුරුවරුන්ගේ අවශ්‍යතාවය ද පෙන්නුම් කර ඇත. අන්තර්ගතය අධික හා විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයෙන් බැහැරව වඩාත් ක්‍රියාකාරී සිසුන්ගේ මැදිහත් වීම දිරිමත් කරන ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ වෙනසකට මෙන්ම අනාගත අර්බුද වඩා හොඳින් සමනය කර ගැනීමට සහ කළමනාකරණය කිරීමට හදිසි සහන හැකියාවන් ඇති කිසිවෙකු හැර නොයන වඩාත් ශක්තිමත් හා උසස් තත්ත්වයේ අධ්‍යාපන ක්‍රමයක් සඳහා සාක්ෂි පදනම් කරගත් පුළුල් උපාය මාර්ගයක් සැලසුම් කිරීම ඉතා වැදගත් වේ.

මෙම සැලසුම සඳහා 2020 වර්ෂයේ දී හා 2021 වර්ෂයේ දී සිසුන්ට අහිමි වූ පාසල් කාලය ද සැලකිල්ලට ගැනීම ඉතා වැදගත් වේ.

**COVID වසංගත තත්වය සමඟ 2020 වර්ෂයේ දී හා 2021 වර්ෂයේ දී සිසුන්ට අහිමි වූ පාසල් කාලය**

| **වර්ෂය** | **පළාත** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| 2020 | බස්නාහිර පළාත | 51.55 |
| | අනෙකුත් පළාත් | 39.7 |
| 2021 | බස්නාහිර පළාත | |
| | - සිංහල මාධ්‍යය හා දෙමල මාධ්‍යය පාසල් | 88.5 |
| | - මුස්ලිම් මාධ්‍යය පාසල් | 92.5 |
| | අනෙකුත් පළාත් | |
| | - සිංහල මාධ්‍යය හා දෙමල මාධ්‍යය පාසල් | 54.2 |
| | - මුස්ලිම් මාධ්‍යය පාසල් | 58.34 |

උක්ත සියලු ම කරුණු සැලකිල්ලට ගනිමින් කඩිනම් විෂයමාලා ප්‍රතිසංස්කරණයක් ක්‍රියාත්මක කිරීමට යෝජනා ඉදිරිපත් වී ඇත. එහි දී අහිමි වූ පාසල් කාලය හා එක් එක් විෂයට යෙදී තිබූ කාලච්ඡේද සැලකිල්ලට ගනිමින් නව විශේෂ විෂයමාලාව සඳහා කාලච්ඡේද වෙන් කර ඇති අතර **ගණිතය විෂයේ 6, 7, 8 හා 9 ශ්‍රේණි සඳහා එක් එක් ශ්‍රේණියට කාලච්ඡේද 100 බැගින් ද 10 හා 11 ශ්‍රේණි සඳහා එක් එක් ශ්‍රේණියට කාලච්ඡේද 120 බැගින්** ද වන සේ කාලච්ඡේද වෙන් කර ඇත.

ඒ අනුව දැනට පවතින විෂය නිර්දේශයන් හි අත්‍යාවශ්‍ය සංකල්ප මෙන්ම එක් එක් ශ්‍රේණියට අදාළ ව 2020 හා 2021 වර්ෂවල ඉගෙනුම් අවස්ථාව අහිමි වූ සංකල්ප හඳුනාගනිමින් යෝජනා කර ඇති කාලයට අනුව අහිමි වූ ඉගෙනුම් අවස්ථා ආවරණය වන පරිදි මෙම විශේෂ විෂය නිර්දේශය සකස් කර ඇත.

# විෂය නිර්දේශය පරිශීලනය සඳහා උපදෙස්

අට ශ්‍රේණි ගණිතය සඳහා සකස් කර ඇති මෙම විෂය නිර්දේශය සකස් කිරීමේ දී සිසු ඉගෙනුම් අවස්ථා අහිමි වීම් ලෙස හත ශ්‍රේණියේ දෙවන හා තුන්වන වාරවලට අදාළ විෂය අන්තර්ගතය මෙන් ම අට ශ්‍රේණියේ වාර තුනට ම අදාළ විෂය අන්තර්ගතය සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව අට ශ්‍රේණිය ගණිතය සඳහා යෝජනා කර ඇති කාලච්ඡේද 100ක් තුළ දී අවරණය කළ හැකි විෂය සංකල්ප මෙහි ඉදිරිපත් කර ඇත.

විෂය නිර්දේශය සැකසීමේ දී ගුරුවරයාගේ පරිශීලනය පහසු කරවීම සඳහා පෙර යෝජනා කර ඇති පාඩම් අනුක්‍රමය අනුව යමින් පිළිවෙලින් පාඩම, හය ශ්‍රේණියේ විෂය අන්තර්ගතය, හත ශ්‍රේණියේ විෂය අන්තර්ගතය, ඉගෙනුම් පල හා යෝජිත කාලච්ඡේද ගණන ලෙස තීර පහක් යටතේ වගුවක ආකාරයට විෂය නිර්දේශය ඉදිරිපත් කර ඇත.

ගණිතය අනෙකුත් සියලු ම විෂයන් හා බද්ධව පැවතීම නිසා අත්‍යාවශ්‍යයැයි සැලකෙන සියලු ම විෂය අන්තර්ගත මෙහි ඇතුළත් කර ඇත. ඊට අමතරව පහත යෝජනා ඉදිරිපත් කර ඇත.

- අට ශ්‍රේණියේ පාඩම් හා බද්ධව ක්‍රියාත්මක කළ හැකි හත ශ්‍රේණියට අදාළ පාඩම් එකට ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරේ. මෙහි දී විෂය අන්තර්ගතය අදාළ පාඩම යටතට වන ලෙස වගුවේ ඉදිරිපත් කර ඇත.
- **එක් එක් පාඩම් මාතෘකා යටතේ පන්ති කාමරය තුළ දී පුහුණු කරනු ලබන අභ්‍යාස ප්‍රමාණය සීමා කිරීමට යෝජනා කෙරේ.** මෙහි දී එක් එක් අභ්‍යාසය යටතේ ගැටලු තෝරා ගැනීම තම පාසලේ සිසුන්ගේ ඉගෙනුම් හැකියාව අනුව තීරණය කිරීමට ගුරුවරයාට නිදහස ලබා දී ඇත.
- ඉදිරි වර්ෂවල දී ක්‍රියාත්මක කිරීමට නියමිත පාඩම් හා සබැඳි විෂය අන්තර්ගතය එම පාඩම් සමඟ එකට ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනු ලැබේ. එවැනි පාඩම් අට ශ්‍රේණියෙන් ඉවත් කිරීම හා ඉදිරියේ දී සාකච්ඡා කරනු ලබන ශ්‍රේණිය පිළිබඳ සටහනක් ද අදාළ වගුවේ දක්වා ඇත.
- යම් පාඩමක් තුළ විෂය අන්තර්ගතයේ කොටසක් පමණක් ඉවත් කර හෝ වෙනත් ශ්‍රේණියක විෂය අන්තර්ගතය හා සම්බන්ධ කර ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති අවස්ථාවල දී ඒ පිළිබඳ ව සටහනක් පාඩම් මාතෘකාව යටතේ සටහන් කර ඇත.
- සිසුන් සඳහා නිවසේ දී කරගෙන ඒමට පැවරිය හැකි ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ ක්‍රියාත්මක නොකර ඒවා නිවසේ දී කරගෙන ඒමට පවරා පසු දින සාකච්ඡා කිරීමට යෝජනා කෙරේ. මෙවැනි අවස්ථා පිළිබඳ සටහනක් අදාළ වගුවේ යෝජිත කාලච්ඡේද තීරයේ ඉදිරිපත් කර ඇත.

ඉහත යෝජනාවලට අමතර ව මේ වන විටත් යම් විෂය කොටසක් ආවරණය කර අවසන් ව ඇත්නම් එම විෂය අන්තර්ගතය සඳහා යෝජනා කර ඇති කාලය අඩු කරගෙන එම කාලය වෙනත් විෂය අන්තර්ගතයක් ආවරණය සඳහා යොදා ගැනීමට ගුරුවරයාට නිදහස ඇත.

පවතින අධ්‍යාපනික අර්බුදය හමුවේ මෙවැනි මග පෙන්වීමේ විශේෂ විෂය නිර්දේශයක් ඔබ වෙත ලබා දෙන්නේ ඒ මගින් ඔබට වඩා හොඳ දායකත්වයක් ලබාදිය හැකිවේය යන විශ්වාසය නිසා වෙනි. පවතින සම්පත් ද්‍රව්‍ය භාවිත කර වඩාත් සංවර්ධනාත්මක ප්‍රවේශයක් ඔස්සේ පන්ති කාමරය හසුරුවා ගැනීමට ඔබට නිදහස ඇත. ඔබ වෙත ලබාදෙන මෙම විශේෂ විෂය නිර්දේශය මැනවින් අධ්‍යයනය කර වඩා නිර්මාණශීලි දරු පරපුරක් බිහි කර ශ්‍රී ලංකාව ආර්ථික හා සමාජීය අතින් ඉදිරියට ගෙන යාමට කැපවීමෙන් යුතුව කටයුතු කරනු ඇතැයි අපගේ විශ්වාසයි.

2020 සහ 2021 වර්ෂවල අහිමි වූ ඉගෙනුම් කාලය ආවරණය සඳහා වූ විශේෂ ගණිතය විෂය නිර්දේශය - අට ශ්‍රේණිය

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 01. සංඛ්‍යා රටා | 9 ශ්‍රේණියේ සංඛ්‍යා රටා පාඩම සමග සම්බන්ධ කර ඇත. | | | |
| 02 පරිමිතිය | • දිග ආශ්‍රිත මිනුම්<br>• එකතු කිරීම, අඩුකිරීම<br>• ගුණ කිරීම, බෙදීම<br>(පූර්ණ සංඛ්‍යාවකින් පමණක්)<br>• පරිමිතිය සඳහා සූත්‍ර භාවිතය<br>• සමපාද ත්‍රිකෝණය<br>• සමචතුරස්‍රය<br>• සෘජුකෝණාස්‍රය | • පරිමිතිය<br>• සංයුක්ත තලරූප (සමපාද/සමද්විපාද ත්‍රිකෝණ, සමචතුරස්‍ර, සෘජුකෝණාස්‍ර යන රූප දෙකකින් සමන්විත) | • cm හා mm ඇතුළත් දිග මිනුම් එකතු කරයි; අඩුකරයි.<br>• m හා cm ඇතුළත් දිග මිනුම් එකතු කරයි; අඩුකරයි.<br>• km හා m ඇතුළත් දිග මිනුම් එකතු කරයි; අඩුකරයි.<br>• cm හා mm ඇතුළත් දිග මිනුම් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කරයි; බෙදයි.<br>• m හා cm ඇතුළත් දිග මිනුම් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කරයි; බෙදයි.<br>• km හා m ඇතුළත් දිග මිනුම් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කරයි; බෙදයි.<br>• විවිධ අවශ්‍යතා සඳහා දිග මිනුම් ආශ්‍රිත ගැටලු විසඳයි.<br>• සංයුක්ත තල රූපයක පරිමිතිය සෙවීමේ දී, සංයුක්ත වීමෙන් සෑදෙන සමස්ත රූපය දෙස අවධානය යොමු කල යුතු බව පිළිගනියි. | 07 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • සමපාද ත්‍රිකෝණ, සමද්විපාද ත්‍රිකෝණ, සමචතුරස්‍ර හා ඍජුකෝණාස්‍ර යන තල රූපවලින් එක ම වර්ගයෙන් හෝ වෙනස් වර්ගවල හැඩ දෙකක් සංයුක්ත වීමෙන් සෑදෙන තලරූපවල පරිමිතිය සොයයි.<br>• සමපාද ත්‍රිකෝණ, සමද්විපාද ත්‍රිකෝණ, සමචතුරස්‍ර හා ඍජුකෝණාස්‍ර යන තල රූප දෙකකින් සමන්විත සංයුක්ත තල රූප ආශ්‍රිත ගැටලු විසඳයි.<br>• සූත්‍ර භාවිතයෙන් සමපාද ත්‍රිකෝණයක, සමචතුරස්‍රයක, ඍජුකෝණාස්‍රයක පරිමිතිය සොයයි.<br>• සමපාද ත්‍රිකෝණයක හෝ සමචතුරස්‍රයක හෝ ඍජුකෝණාස්‍රයක හෝ පරිමිතිය දී ඇති විට පැත්තක දිග සොයයි.<br>• පරිමිතිය ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා සූත්‍ර භාවිත කරයි. | |
| 03. කෝණ | | • කෝණ යුගල හැඳින්වීම හා කෝණ ආශ්‍රිත සරල ගණනය කිරීම්.<br>  • බද්ධ කෝණ<br>  • අනුපූරක කෝණ | • සරල උදාහරණ ඇසුරෙන් අනුපූරක කෝණ, පරිපූරක කෝණ, බද්ධ කෝණ සහ ප්‍රතිමුඛ කෝණ හඳුනාගනියි.<br>• අනුපූරක බද්ධ කෝණ යුගලයක ඓක්‍යය $90^{0}$ බව හඳුනා ගනියි. | 03 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | • පරිපූරක කෝණ<br>• ප්‍රතිමුඛ කෝණ<br>• කෝණයක විශාලත්වය ගණනය කිරීම.<br>• සරල රේඛාවක් මත පිහිටි කෝණ<br>• ලක්ෂ්‍යයක් වටා කෝණ | • පරිපූරක බද්ධ කෝණ යුගලයක එකාය $180^0$ බව හඳුනා ගනියි.<br>• සරල රේඛා දෙකක් එකිනෙක ඡේදනය වූ විට සෑදෙන ප්‍රතිමුඛ කෝණ විශාලත්වයෙන් සමාන බව හඳුනා ගනියි.<br>• අනුපූරක කෝණ, පරිපූරක කෝණ, බද්ධ කෝණ සහ ප්‍රතිමුඛ කෝණ ආශ්‍රිත සරල ගණනය කිරීම් සිදු කරයි.<br>• සරල රේඛාවක් මත ලක්ෂ්‍යයක පිහිටි කෝණ සියල්ලෙහි එකාය $180^0$ බව හඳුනා ගනියි.<br>• ලක්ෂ්‍යයක් වටා පිහිටි කෝණ සියල්ලෙහි ම එකාය $360^0$ බව හඳුනා ගනියි.<br>• සරල රේඛාවක් මත පිහිටි කෝණ සහ ලක්ෂ්‍යයක් වටා පිහිටි කෝණ ආශ්‍රිත ගණනය කිරීම් සිදු කරයි. | |
| 04. සදිශ සංඛ්‍යා | | • නිඛිල<br>• අඩුකිරීම<br>• ගුණ කිරීම<br>• බෙදීම<br>• සදිශ සංඛ්‍යා | • නිඛිල අඩු කිරීම සඳහා ආකලනය යොදා ගත හැකි බව ප්‍රකාශ කරයි.<br>• නිඛිල අඩු කරයි.<br>• නිඛිල ගුණ කරයි.<br>• නිඛිල බෙදයි. | 03 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | • අඩු කිරීම<br>• ගුණ කිරීම<br>• බෙදීම | • ආකලනය යොදා ගනිමින් සදිශ සංඛ්‍යා අඩු කරයි.<br>• සදිශ සංඛ්‍යා ගුණ කරයි.<br>• සදිශ සංඛ්‍යා බෙදයි. | |
| 05. වීජීය ප්‍රකාශන | • වීජීය ප්‍රකාශන<br>  • වීජීය ප්‍රකාශන ගොඩ නැගීම<br>    • පූර්ණ සංඛ්‍යා සහ භාග සංගුණක සහිත (මූලික ගණිත කර්ම හතර ම ඇතුළත්)<br>    • අඥාත දෙකකට නොවැඩි<br>• වීජීය ප්‍රකාශනයක පද<br>  • එකතු කිරීම.<br>  • අඩු කිරීම. (සජාතීය හා විජාතීය පද ඇතුළත්) | • වීජීය ප්‍රකාශන<br>  • වීජීය ප්‍රකාශන ගොඩනැගීම<br>  • ගුණ කිරීම<br>    • වීජීය ප්‍රකාශනයක් සංඛ්‍යාවකින්<br>    • වීජීය ද්විපද ප්‍රකාශනයක් වීජීය පදයකින්<br>  • සුළු කිරීම (එකතු කිරීම, අඩු කිරීම හා වරහනක් සහිත) | • එක් ගණිත කර්මයක් පමණක් යොදා ගනිමින් එක් අඥාතයක් සහිත භාගමය සංගුණකයක් ඇති ඒකජ වීජීය ප්‍රකාශන ගොඩනගයි.<br>• ගණිත කර්ම කිහිපයක් යොදා ගනිමින් එක් අඥාතයක් සහිත භාගමය සංගුණක ඇති ඒකජ වීජීය ප්‍රකාශන ගොඩනගයි.<br>• එක් ගණිත කර්මයක් පමණක් යොදා ගනිමින් අඥාත දෙකක් සහිත සංගුණක පූර්ණ සංඛ්‍යාවක් වන ඒකජ වීජීය ප්‍රකාශන ගොඩනගයි.<br>• ගණිත කර්ම කිහිපයක් යොදා ගනිමින් අඥාත දෙකක් සහිත සංගුණක පූර්ණ සංඛ්‍යාවක් වන ඒකජ වීජීය ප්‍රකාශන ගොඩනගයි.<br>• එක් ගණිත කර්මයක් පමණක් යොදා ගනිමින් අඥාත දෙකක් සහිත භාගමය සංගුණක ඇති ඒකජ වීජීය ප්‍රකාශන ගොඩනගයි.<br>• ගණිත කර්ම කිහිපයක් යොදා ගනිමින් අඥාත දෙකක් සහිත භාගමය සංගුණක ඇති ඒකජ වීජීය ප්‍රකාශන ගොඩනගයි. | 07 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | • ගුණ කිරීම<br>• වීජීය ඒකජ පදයක් පූර්ණ සංඛ්‍යාවකින් | | • ගණිත කර්ම කිහිපයක් යොදා ගනිමින් අඥාත තුනක් තෙක් ඇති විජීය ප්‍රකාශන ගොඩනගයි.<br>• වරහනක් සහිත අඥාත තුනක් තෙක් ඇති වීජීය ප්‍රකාශන ගොඩනගයි.<br>• වරහන් රහිත විජීය ප්‍රකාශනයක් සංඛ්‍යාවකින් ගුණ කරයි.<br>• වරහන් රහිත ද්විපද විජීය ප්‍රකාශනයක් වීජීය පදයකින් ගුණකරයි.<br>• එකතු කිරීම, අඩු කිරීම හා සුළු වරහන සහිත වීජීය ප්‍රකාශන සුළු කරයි.<br>• විජීය ප්‍රකාශනයක වරහන් ඉවත් කිරීමේ දී වරහනට පිටතින් ඇති සංඛ්‍යාවෙන් හෝ වීජීය පදයෙන් වරහන තුළ ඇති පද ගුණ කළ යුතු බව පිළිගනියි.<br>• වීජීය පද සමූහයකින් සජාතීය සහ විජාතීය පද වෙන් කර දක්වයි.<br>• වීජීය පදයක සංගුණකය හඳුනා ගනියි.<br>• සජාතීය ඒකජ වීජීය පද කීපයක් එකතු කරයි.<br>• පිළිතුර ධන වන පරිදි සංගුණක ධන වන සජාතීය ඒකජ වීජීය පද දෙකක් අඩු කරයි. | |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • සජාතීය හා විජාතීය පද ඇතුළත් ඒකජ වීජීය ප්‍රකාශනයක් සුළු කර දක්වයි.<br>• ධන පූර්ණ සංඛ්‍යාමය සංගුණකයක් ඇති ඒකජ වීජීය පදයක් ධන පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කරයි. | |
| 06. ඝන වස්තු | 9 ශ්‍රේණියේ ඝන වස්තු පාඩම සමග සම්බන්ධ කර ඇත. | | | |
| 07. සාධක | | • වීජීය පද තුනක් තෙක් වූ පද කාණ්ඩයක මහා පොදු සාධකය සෙවීම<br>• වීජීය ප්‍රකාශනවල පොදු සාධක (පද3ක් තෙක්)<br>• පොදු සාධකය පූර්ණ සංඛ්‍යාවක් වන<br>• පොදු සාධකය වීජීය පදයක් වන | • වීජීය පද තුනක් තෙක් වූ පද කාණ්ඩයක මහාම පොදු සාධකය සොයයි.<br>• පොදු සාධකය පූර්ණ සංඛ්‍යාවක් වන පරිදි වූ වීජීය ප්‍රකාශනයක පොදු සාධකය වෙන්කර ලියයි.<br>• පොදු සාධකය වීජීය පදයක් වන පරිදි වූ වීජීය ප්‍රකාශනයක පොදු සාධකය වෙන් කර ලියයි.<br>• පොදු සාධකයෙන් ගුණ කිරීම මගින්, වීජීය ප්‍රකාශනයක පොදු සාධක වෙන් කිරීමේ නිරවද්‍යතාව පරීක්ෂා කරයි | 04 |
| 08. වර්ග මූලය (නිරීක්ෂණයෙන් වර්ගමූලය සෙවීම ඉවත් කර ඇත.) | | • පූර්ණ වර්ග සංඛ්‍යා<br>• වර්ගය (1-20 තෙක්)<br>• වර්ගමූලය (1- 1000 තෙක්)<br>• ප්‍රථමක සාධක මගින් | • 1 සිට 20 තෙක් පූර්ණ සංඛ්‍යාවල වර්ගය සොයයි.<br>• සංඛ්‍යාවක වර්ගමූලය, සංකේතය මගින් දක්වයි.<br>• 1 සිට 1000 තෙක් පූර්ණ වර්ග සංඛ්‍යාවල වර්ගමූලය ප්‍රථමක සාධක භාවිතයෙන් සොයයි. | 02 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 09. ස්කන්ධය<br>(මෙට්‍රික් ටොන් ආශ්‍රිත ගැටලු විසඳීම අවශ්‍ය නොවේ.) | • ස්කන්ධය<br>  • මිලිග්‍රෑම් හා ග්‍රෑම් අතර සම්බන්ධය<br>  • ස්කන්ධ නිමානය<br>• ස්කන්ධ (mg, g, kg)<br>  • එකතු කිරීම හා අඩු කිරීම<br>  • ගුණ කිරීම හා බෙදීම (පූර්ණ සංඛ්‍යාවකින් පමණක්) | • කිලෝග්‍රෑම් හා මෙට්‍රික් ටොන් අතර සම්බන්ධය<br>• කිලෝග්‍රෑම් මෙට්‍රික් ටොන් පරිවර්තනය | • mg හා g අතර සම්බන්ධය ප්‍රකාශ කරයි.<br>• mg $\rightleftharpoons$ g පරිවර්තනය කරයි.<br>• දෙන ලද ද්‍රව්‍යයක හෝ ද්‍රව්‍ය ප්‍රමාණයක ස්කන්ධය නිමානය කරයි.<br>• mg හා g ඇතුළත් ස්කන්ධ එකතු කරයි; අඩු කරයි.<br>• mg හා g ඇතුළත් ස්කන්ධ පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කරයි; බෙදයි.<br>• g හා kg ඇතුළත් ස්කන්ධ පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කරයි; බෙදයි.<br>• ස්කන්ධ ආශ්‍රිත ගැටලු විසඳයි.<br>• මෙට්‍රික් ටොන් සහ කිලෝග්‍රෑම් අතර සම්බන්ධය ප්‍රකාශ කරයි.<br>• kg $\rightleftharpoons$ t පරිවර්තනය කරයි.<br>• ස්කන්ධය මැනීම සඳහා භාවිත වන ඒකක හඳුනා ගනියි. | 04 |
| 10. දර්ශක | | • ගුණිතයක බල ප්‍රසාරණය<br>• සෘණ නිඛිලයක බලය (දර්ශකය 1-4 තෙක්) | • ප්‍රකෘති සංඛ්‍යා හෝ වීජීය පද හෝ දෙකක ගුණිතයෙහි,<br>• දර්ශකය තුනට නොවැඩි වූ ප්‍රකෘති සංඛ්‍යාමය බල ප්‍රසාරණය කරයි. | 02 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • ඝෘණ නිඛිලයක , දර්ශකය 4 ට නොවැඩි වූ බලයක් ප්‍රසාරණය<br>• කර අගය ලියා දක්වයි. ඝෘණ නිඛිලයක බලයෙහි දර්ශකය, ඉරට්ට හෝ ඔත්තේ වීම අනුව, අගය වෙනස් වන ආකාරය පැහැදිලි කරයි | |
| 11. සමමිතිය | මෙම පාඩම ඉවත් කර ඇත. | | | |
| 12. ත්‍රිකෝණ හා චතුරස්‍ර | • සරල රේඛීය තල රූප<br>• ත්‍රිකෝණ වර්ග කිරීම<br>• කෝණ අනුව<br>• පාද අනුව<br>• බහු අස්‍ර වර්ගීකරණය<br>• උත්තල<br>• අවතල<br>• සවිධි | • තලරූපවල අභ්‍යන්තර කෝණ හා බාහිර කෝණ ඇඳීම<br>• ත්‍රිකෝණය<br>• චතුරස්‍රය<br>• අභ්‍යන්තර කෝණ ඇසුරෙන් බාහිර කෝණ ගණනය කිරීම<br>• ත්‍රිකෝණය<br>• චතුරස්‍ර | • ත්‍රිකෝණයක අංග ලෙස එහි කෝණ තුන සහ පාද තුන හඳුනා ගනියි.<br>• සියලු ම කෝණ සුළු කෝණ වන ත්‍රිකෝණය, සුළු කෝණික ත්‍රිකෝණයක් ලෙස හඳුනා ගනියි.<br>• ඍජුකෝණයක් සහිත ත්‍රිකෝණය ඍජුකෝණී ත්‍රිකෝණයක් ලෙස හඳුනා ගනියි.<br>• මහා කෝණයක් සහිත ත්‍රිකෝණය මහා කෝණී ත්‍රිකෝණයක් ලෙස හඳුනා ගනියි.<br>• පාද තුන ම දිගින් සමාන ත්‍රිකෝණයක් සමපාද ත්‍රිකෝණයක් ලෙස හඳුනා ගනියි.<br>• පාද දෙකක් දිගින් සමාන වන ත්‍රිකෝණය සමද්විපාද ත්‍රිකෝණය ලෙස හඳුනා ගනියි.<br>• පාද තුන දිගින් එකිනෙකට වෙනස් වූ ත්‍රිකෝණ විෂම ත්‍රිකෝණ ලෙස හඳුනා ගනියි. | 06 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • සරල රේඛා කණ්ඩවලින් වටවූ සංවෘත තල රූපයක් බහු අස්‍රයක් ලෙස හඳුනා ගනියි.<br>• සරල දාරය භාවිතයෙන් විවිධ බහු අස්‍ර අඳියි.<br>• සෑම අභ්‍යන්තර කෝණයක ම අගය 1800 ට වඩා අඩුවන පරිදි වූ බහු අස්‍ර, උත්තල බහු අස්‍ර ලෙස හඳුනා ගනියි.<br>• එක් අභ්‍යන්තර කෝණයක් හෝ 1800 ට වැඩි අගයක් වන පරිදි වූ බහු අස්‍ර, අවතල බහු අස්‍ර ලෙස හඳුනා ගනියි.<br>• පාද සමාන වුත් කෝණ සියල්ලම සමාන වූත් බහු අස්‍ර. සවිධි බහු අස්‍ර ලෙස හඳුනා ගනියි.<br>• දෙන ලද බහු අස්‍රයක් උත්තල, අවතල, සවිධි හෝ සවිධි නොවන බහු අස්‍රයක් ලෙස හේතු දක්වමින් වර්ගීකරණයේ යෙදෙයි.<br>• ඕනෑ ම අවතල බහු අස්‍රයක් සවිධි බහු අස්‍රයක් නොවන බවට හේතු දක්වයි.<br>• ත්‍රිකෝණයක අභ්‍යන්තර කෝණ තුනෙහි ඓක්‍යය $180^0$බව ප්‍රකාශ කරයි.<br>• උත්තල චතුරස්‍රයක අභ්‍යන්තර කෝණ සියල්ලෙහි ඓක්‍යය $360^0$බව ප්‍රකාශ කරයි. | |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • රූප සටහන් ඇසුරින් උත්තල බහු අස්‍රයක බාහිර කෝණ නිවැරදිව හඳුනා ගනියි.<br>• ත්‍රිකෝණ හා උත්තල චතුරස්‍රවල එක් එක් පාද දික් කිරීමෙන් බාහිර කෝණ අඳියි<br>• ත්‍රිකෝණයක හා චතුරස්‍රයක, ඕනෑ ම ශීර්ෂයක දී බාහිර කෝණයේත් අභ්‍යන්තර කෝණයේත් එෙකාය $180^0$බව ප්‍රකාශ කරයි.<br>• ත්‍රිකෝණයකත් චතුරස්‍රයකත් බාහිර කෝණ එෙකාය $360^0$බව ප්‍රකාශ කරයි.<br>• ත්‍රිකෝණ හා උත්තල චතුරස්‍රවල අභ්‍යන්තර කෝණයක් දී ඇති විට ඒ ආශ්‍රිත බාහිර කෝණය ගණනය කරයි.<br>• ත්‍රිකෝණ හා උත්තල චතුරස්‍රවල අභ්‍යන්තර කෝණ ආශ්‍රිත සරල ගණනය කිරීම් නිවැරදි ව කරයි. | |
| 13. භාග I | • භාග<br>• මිශ්‍ර සංඛ්‍යා හැඳින්වීම<br>• විෂම භාග හැඳින්වීම | • ගුණකිරීම්<br>• භාගයක් පූර්ණ සංඛ්‍යාවකින්<br>• භාගයක් භාගයකින් | • පුන පුනා එකතු කිරීම මගින් භාග සංඛ්‍යාවක් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කිරීම සිදුකරන ආකාරය විස්තර කරයි.<br>• භාගයක් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කරයි. | 08 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | • පරිවර්තනය<br>• විෂම භාග හා මිශ්‍ර සංඛ්‍යා<br>• සැසඳීම<br>• අසම්බන්ධිත හර සහිත භාග (හරය 12 හෝ ඊට අඩු)<br>• එකතු කිරීම හා අඩු කිරීම<br>• මිශ්‍ර සංඛ්‍යා සහිත | • භාගයක් මිශ්‍ර සංඛ්‍යාවකින්<br>• මිශ්‍ර සංඛ්‍යාවක් මිශ්‍ර සංඛ්‍යාවකින් | • භාග දෙකක් ගුණ කිරීමේ දී, ඒවායේ ලවයන් හා හරයන් වෙන වෙන ම ගුණ කළ යුතු බව ප්‍රකාශ කරයි.<br>• භාගයක් භාගයකින් ගුණ කරයි.<br>• මිශ්‍ර සංඛ්‍යාවක් භාගයකින් ගුණ කරයි.<br>• මිශ්‍ර සංඛ්‍යාවක් මිශ්‍ර සංඛ්‍යාවකින් ගුණ කරයි.<br>• මිශ්‍ර සංඛ්‍යාවක් පූර්ණ සංඛ්‍යාවකින් හා තත්‍ය භාගයකින් (නියම භාගයකින්) යුක්ත බව හඳුනා ගනියි.<br>• ලවය, හරයට සමාන හෝ විශාල වූ භාග විෂම භාග ලෙස ප්‍රකාශ කරයි.<br>• මිශ්‍ර සංඛ්‍යාවක් විෂම භාගයක් බවට පරිවර්තනය කරයි.<br>• විෂම භාගයක් මිශ්‍ර සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරයි.<br>• හරය 12 හෝ ඊට අඩු වූ අසම්බන්ධිත හර සහිත භාග සසඳයි.<br>• මිශ්‍ර සංඛ්‍යා දෙකක් එකතු කිරීමේ දී හෝ අඩු කිරීමේ දී ඒවා විෂම භාග බවට හැරවීමෙන් හෝ පූර්ණ සංඛ්‍යා හා නියම භාග වෙන් කිරීමෙන් සුළු කළ හැකි බව ප්‍රකාශ කරයි. | |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • හරය සමාන මිශ්‍ර සංඛ්‍යා සහ තත්‍ය භාග (නියම භාග) ඇතුළත් සංඛ්‍යා තුනකට නොවැඩි ගණනක් එකතු කරයි.<br>• හරය සම්බන්ධිත මිශ්‍ර සංඛ්‍යා හා තත්‍ය භාග (නියම භාග) ඇතුළත් සංඛ්‍යා තුනකට නොවැඩි ගණනක් එකතු කරයි.<br>• හරය අසම්බන්ධිත මිශ්‍ර සංඛ්‍යා හා තත්‍ය භාග (නියම භාග) ඇතුළත් සංඛ්‍යා තුනකට නොවැඩි ගණනක් එකතු කරයි.<br>• මිශ්‍ර සංඛ්‍යාවකින් එහි හරයට සමාන හරයක් සහිත තත්‍ය භාගයක් (නියම භාගයක්) අඩු කරයි.<br>• මිශ්‍ර සංඛ්‍යාවකින් එහි හරයට සම්බන්ධිත හරයක් සහිත තත්‍ය භාගයක් (නියම භාගයක්) අඩු කරයි.<br>• මිශ්‍ර සංඛ්‍යාවකින් එහි හරයට අසම්බන්ධිත හරයක් සහිත තත්‍ය භාගයක් (නියම භාගයක්) අඩු කරයි.<br>• මිශ්‍ර සංඛ්‍යාවකින් එහි හරයට සමාන හරයක් සහිත මිශ්‍ර සංඛ්‍යාවක් අඩු කරයි.<br>• මිශ්‍ර සංඛ්‍යාවකින් එහි හරයට සම්බන්ධිත හරයක් සහිත මිශ්‍ර සංඛ්‍යාවක් අඩු කරයි.<br>• මිශ්‍ර සංඛ්‍යාවකින් එහි හරයට අසම්බන්ධිත හරයක් සහිත මිශ්‍ර සංඛ්‍යාවක් අඩු කරයි. | |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • එකතු කිරීම හා අඩු කිරීම ඇතුළත් භාග සහිත ප්‍රකාශන සුළු කරයි. | |
| 14. භාග II | | • පරස්පරය<br>• පූර්ණ සංඛ්‍යාවක<br>• භාගයක<br>• බෙදීම<br>• භාගයක් පූර්ණ සංඛ්‍යාවකින්<br>• පූර්ණ සංඛ්‍යාවක් භාගයකින්<br>• භාගයක් භාගයකින් භාගයක් මිශ්‍ර සංඛ්‍යාවකින්<br>• මිශ්‍ර සංඛ්‍යාවක් මිශ්‍ර සංඛ්‍යාවකින් | • සංඛ්‍යාවකින් 1 ලබා ගැනීමට එම සංඛ්‍යාව ගුණ කළ යුතු සංඛ්‍යාව, මුල් සංඛ්‍යාවේ පරස්පරය ලෙස හඳුනා ගනියි.<br>• භාගයක පරස්පරය ලියා දක්වයි.<br>• පූර්ණ සංඛ්‍යාවක පරස්පරය ලියා දක්වයි.<br>• සංඛ්‍යාවක්, එම සංඛ්‍යාවෙන් බෙදීමෙන් ලැබෙන අගයත් එම සංඛ්‍යාව, එහි පරස්පරයෙන් ගුණ කිරීමෙන් ලැබෙන අගයත් සමාන වීම භාවිත කොට, භාග බෙදීම සඳහා ක්‍රමයක් විස්තර කරයි.<br>• භාගයක් භාගයකින් බෙදයි.<br>• භාගයක් පූර්ණ සංඛ්‍යාවකින් බෙදයි.<br>• පූර්ණ සංඛ්‍යාවක්, භාගයකින් බෙදයි.<br>• භාගයක්, මිශ්‍ර සංඛ්‍යාවකින් බෙදයි.<br>• මිශ්‍ර සංඛ්‍යාවක්, මිශ්‍ර සංඛ්‍යාවකින් බෙදයි | 04 |
| 15 දශම | • දශම පරිවර්තනය<br>• අන්ත දශම ⇌ භාග<br>• ගුණ කිරීම හා බෙදීම | • ගුණ කිරීම<br>• පූර්ණ සංඛ්‍යාවක් දශමයකින් | • හරය, 10 යේ බල වූ භාග දෙකක් ගුණ කිරීම මගින් දශම සංඛ්‍යා දෙකක් ගුණ කිරීම විස්තර කරයි.<br>• පූර්ණ සංඛ්‍යාවක්, දශමයකින් ගුණ කරයි. | 06 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | • 10 බලවලින්<br>• පූර්ණ සංඛ්‍යාවකින් | • දශමයක් දශමයකින්<br>• බෙදීම<br>• පූර්ණ සංඛ්‍යාවක් දශමයකින්<br>• දශමයක් දශමයකින් | • දශමයක්, දශමයකින් ගුණ කරයි.<br>• හරය, 10 යේ බල වූ භාග දෙකක බෙදීම ඇසුරෙන් දශම බෙදීම සිදුවන ආකාරය විස්තර කරයි.<br>• පූර්ණ සංඛ්‍යාවක් , දශමයකින් බෙදයි.<br>• දශමයක්, දශමයකින් බෙදයි.<br>• අන්ත දශම ලෙස පරිවර්තනය කළ හැකි භාග, දශම සංඛ්‍යා බවට පරිවර්තනය කරයි.<br>• අන්ත දශම සංඛ්‍යාවක් භාගයක් බවට පරිවර්තනය කර එය සරල ම භාගය ලෙස ලියයි.<br>• දශම සංඛ්‍යාවක් 10 බලවලින් ගුණ කරයි.<br>• දශම සංඛ්‍යාවක් 10 බලවලින් බෙදයි.<br>• දශම සංඛ්‍යාවක් පුර්ණ සංඛ්‍යාවකින් ගුණ කරයි.<br>• දශම සංඛ්‍යාවක් පුර්ණ සංඛ්‍යාවකින් බෙදයි.<br>• දශම ආශ්‍රිත ගැටලු විසඳයි. | |
| 16 අනුපාත | • අනුපාත<br>• අනුපාතයකට බෙදීම (පද තුනක් තෙක්) | • අනුපාතයක් භාගයක් ලෙස දැක්වීම<br>• අනුපාතයකට බෙදීම<br>• රාශි දෙකක් සංයුක්ත වී ඇති අවස්ථා | • රාශි දෙකක් සංයුක්ත කිරීමෙන් ගොඩනගා ගන්නා අනුපාතයකට අනුව බෙදීම සිදු කරයි<br>• රාශි දෙකක් අතර අනුපාතය සහ ඉන් එක් රාශියක් හා තවත් රාශියක් අතර අනුපාතය දී ඇති විට එම | 04 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | • මුළු ප්‍රමාණය ගණනය කිරීම | • සංයුක්ත අනුපාත (තුල්‍ය අනුපාත මගින්) | රාශි තුන සංයුක්ත කරමින් සංයුක්ත අනුපාත ගොඩනගයි.<br>• සංයුක්ත අනුපාත ඇතුළත් ගැටලු විසඳයි<br>• ප්‍රමාණයක්, පද 3ක් තෙක් වූ අනුපාතයකට අනුව බෙදා දක්වයි.<br>• අනුපාතයක එක් පදයකට අදාළ අගය සහ අනුපාතය දී ඇති විට, මුළු ප්‍රමාණය ගණනය කරයි.<br>• අනුපාතයේ එක් පදයකට අදාළ අගය සහ අනුපාතය දී ඇති විට, අනෙක් පදවලට අදාළ අගයන් ගණනය කරයි.<br>• අනුපාත දැනුම, ප්‍රායෝගික අවස්ථා සඳහා යොදා ගනියි. | |
| 17. සමීකරණ<br>(7 ශ්‍රේණියේ ගැලීම් සටහන් මගින් සමීකරණ විසඳීම ඉවත් කර ඇත.) | • සරල සමීකරණ ගොඩනැගීම<br>• $ax \pm b = c$ ආකාරය<br>$a, b, c \in \mathbb{Z}, a \neq 0$ | • සරල සමීකරණ ගොඩනැගීම<br>• $ax \pm b = c$ ආකාරය, $a, b, c \in \mathbb{Q}, a \neq 0$<br>• සරල සමීකරණ විසඳීම<br>• සංගුණකය භාග ද වන එක් වරහනක් සහිත | • දෙන ලද දත්ත අනුව, $a, b, c \in \mathbb{Z}, a \neq 0$ වන පරිදි $x \pm a = b$ ආකාරයේ සරල සමීකරණ ගොඩ නගයි.<br>• දෙන ලද දත්ත අනුව, $a, b, c \in \mathbb{Z}, a \neq 0$ වන පරිදි $ax = b$ ආකාරයේ සරල සමීකරණ ගොඩ නගයි. | 06 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | • සරල සමීකරණ විසඳීම (විසඳුම ධන සංඛ්‍යාවක් වන)<br>• වීජීය ක්‍රම මගින්<br>• සූත්‍ර ගොඩ නැගීම (විචල්‍ය තුනක් තෙක්)<br>• ආදේශය (ධන පූර්ණ සංඛ්‍යා) | | • දෙන ලද දත්ත අනුව, $a, b, c \in \mathbb{Z}, a \neq 0$ වන පරිදි $ax \pm b = c$ ආකාරයේ සරල සමීකරණ ගොඩනගයි.<br>• සරල සමීකරණ විසඳීම සඳහා ප්‍රතිලෝම ගණිත කර්ම අවබෝධයෙන් යුතු ව භාවිත කළ යුතු බව පිළිගනියි.<br>• විසඳුම ධන වන පරිදි $a, b, c \in \mathbb{Z}, a \neq 0$ වූ $x \pm a = b, ax = b, ax \pm b = c$ ආකාරයේ සමීකරණ වීජීය ක්‍රම මගින් විසඳයි.<br>• සමීකරණයේ විසඳුම්, සමීකරණයට ආදේශයෙන් විසඳුමේ නිරවද්‍යතාව පරීක්ෂා කරයි.<br>• සරල සමීකරණ විසඳීම ආශ්‍රිත දැනුම භාවිතයෙන් ගැටලු විසඳයි.<br>• දෙන ලද දත්ත අනුව $a, b, c \in \mathbb{Q}, a \neq 0$ වූ $ax \pm b = c$ ආකාරයේ සරල සමීකරණ ගොඩනගයි.<br>• එක් වරහනක් සහිත සරල සමීකරණ ගොඩනගයි.<br>• $ax \pm b = c$ ආකාරයේ සරල සමීකරණ විසඳයි.<br>• එක් වරහනක් සහිත සරල සමීකරණ විසඳයි.<br>• විසඳුම, සරල සමීකරණයෙහි ආදේශ කිරීමෙන් විසඳුමෙහි නිරවද්‍යතාව පරීක්ෂා කරයි. | |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • සරල සමීකරණ පිළිබඳ දැනුම යොදා ගනිමින් ගැටලු විසඳයි.<br>• විචල්‍යය දෙකක් අතර සම්බන්ධයක් ඇසුරෙන් සරල සූත්‍ර ගොඩනගයි.<br>• විචල්‍යය තුනක් අතර සම්බන්ධයක් ඇසුරෙන් සරල සූත්‍ර ගොඩ නගයි.<br>• සරල සූත්‍රයක විචල්‍ය සඳහා ධන පූර්ණ සංඛ්‍යා ආදේශ කරමින් අගය සොයයි.<br>• සූත්‍ර පිළිබඳ දැනුම යොදා ගනිමින් එදිනෙදා ජීවිතයේ ගැටලු පහසුවෙන් විසඳයි. | |
| 18. ප්‍රතිශත<br>(8 ශ්‍රේණියේ අනුපාත ⇌ ප්‍රතිශත කොටස ඉවත් කර ඇත.) | • ප්‍රතිශත<br>  • සංකල්පය<br>  • පරිවර්තනය<br>    • භාග → ප්‍රතිශත (හරය 100 හි සාධක වන)<br>    • දශම → ප්‍රතිශත | • පරිවර්තනය<br>  • භාග ⇌ ප්‍රතිශත<br>• ගැටලු විසඳීම<br>  • රාශියකින් ප්‍රතිශත<br>  • ප්‍රතිශතයක් දුන්විට රාශිය | • ප්‍රතිශත සංකල්ප විස්තර කරයි.<br>• ප්‍රතිශතයක් නිරූපණය සඳහා "%" සංකේතය භාවිත කරයි.<br>• හරය, 100හි සාධක වන භාග, ප්‍රතිශත ලෙස ලියයි.<br>• දශමස්ථාන දෙකක් තෙක් වූ දශම සංඛ්‍යාවක් ප්‍රතිශතයක් ලෙස ලියයි.<br>• ප්‍රතිශතයකට අයත් මූලික ලක්ෂණ හඳුනා ගනිමින් භාග, ප්‍රතිශත ලෙස ලියා දක්වයි.<br>• ප්‍රතිශත, භාග ලෙස ලියා දක්වයි | 06 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • රාශියක් හා එයින් කිසියම් ප්‍රමාණයක් දුන් විට ඊට අදාළ ප්‍රතිශතය ගණනය කරයි.<br>• මුළු රාශිය හා ප්‍රතිශතයක් දුන් විට, එයට අයත් රාශි ප්‍රමාණය සොයයි.<br>• රාශියකින් යම් ප්‍රමාණයක් හා ඊට අදාල ප්‍රතිශතය දුන් විට, මුළු ප්‍රමාණය සොයයි. | |
| 19. කුලක | 9 ශ්‍රේණියේ කුලක පාඩම සමග සම්බන්ධ කර ඇත. | | | |
| 20. වර්ගඵලය | • වර්ගඵලය<br>  • සමචතුරස්‍රය<br>  • සෘජුකෝණාස්‍රය<br>• සම්මත ඒකක $(\mathrm{cm}^2, \mathrm{m}^2)$<br>• සංයුක්ත තලරූපවල වර්ගඵලය (සමචතුරස්‍රය හා සෘජුකෝණාස්‍රය සහිත) | • වර්ගඵලය<br>  • සෘජුකෝණි ත්‍රිකෝණ<br>  • ත්‍රිකෝණ<br>  • සංයුක්ත තලරූප (ත්‍රිකෝණ/සෘජුකෝණි, ත්‍රිකෝණ, සමචතුරස්‍ර සෘජුකෝණාස්‍ර යන තලරූප දෙකකින් සමන්විත) | • වර්ගඵලය සෙවීමේ සම්මත ඒකක හඳුනා ගනියි.<br>• සූත්‍ර භාවිතයෙන් සමචතුරස්‍රයක වර්ගඵලය සොයයි.<br>• සූත්‍ර භාවිතයෙන් සෘජුකෝණාස්‍රයක වර්ගඵලය සොයයි.<br>• සෘජුකෝණාස්‍රයක වර්ගඵලය සමඟ දිග හෝ පළල දී ඇතිවිට ඉතිරි මිණුම සොයයි.<br>• සෘජුකෝණාස්‍රයක වර්ගඵලය ඇසුරෙන් සෘජුකෝණි ත්‍රිකෝණයක වර්ගඵලය සොයයි.<br>• ඕනෑම ත්‍රිකෝණයක වර්ගඵලය, $\frac{1}{2}$ ආධාරකය $\times$ ලම්බ උස මගින් ලබා ගතහැකි බව පිළිගනියි. | 04<br><br>සංයුක්ත තලරූප පිළිබඳ ව සාකච්ඡාවේ දී 7 සහ 8 ශ්‍රේණිවල කොටස් එකවර සාකච්ඡා කරන්න |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • සූත්‍රය භාවිතයෙන් ත්‍රිකෝණයක වර්ගඵලය සොයයි.<br>• ත්‍රිකෝණයක වර්ගඵලය ආශ්‍රිත ගැටලු විසඳයි.<br>• සංයුක්ත තලරූපයක වර්ගඵලය සෙවීමේ දී එය සුදුසු පරිදි කොටස්වලට වෙන් කර ගතයුතු බව පිළිගනියි.<br>• සමචතුරස්‍ර හා සෘජුකෝණාස්‍ර ඇතුළත් සංයුක්ත තල රූපවල වර්ගඵලය සොයයි.<br>• සමචතුරස්‍ර හා සෘජුකෝණාස්‍ර ඇතුළත් සංයුක්ත තල රූපවල වර්ගඵලය ආශ්‍රිත ගැටලු විසඳයි.<br>• ත්‍රිකෝණ, සමචතුරස්‍ර, සෘජුකෝණාස්‍ර යන තලරූපවලින් එකම වර්ගයෙන් හෝ වෙනස් වර්ගවල හැඩ දෙකක් සංයුක්ත වීමෙන් සෑදෙන තලරූපවල වර්ගඵලය සොයයි. | |
| 21. කාලය | මෙම පාඩම ඉවත් කර ඇත. | | | |
| 22. පරිමාව හා ධාරිතාව | • පරිමාව (ඝනක සහ ඝනකාභවල)<br>• සංකල්පය<br>• සම්මත ඒකකවලින් පරිමාව ($\mathrm{cm}^3, \mathrm{m}^3$) | • පරිමාව පිළිබඳ සූත්‍ර<br>• ඝනකය<br>• ඝනකාභය<br>• ධාරිතාව | • පරිමාව සංකල්පය විස්තර කරයි.<br>• ඝනකයක පරිමාව සම්මත ඒකකවලින් ප්‍රකාශ කරයි.<br>• ඝනකාභයක පරිමාව සම්මත ඒකකවලින් ප්‍රකාශ කරයි. | 06<br>(7 හා 8 ශ්‍රේණියේ ඝනක හා ඝනකාභවල |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | • පරිමාව නිමානය<br>• ද්‍රව මිනුම්<br>• මිනුම් ඒකක (ml, l)<br>• ගුණ කිරීම (පූර්ණ සංඛ්‍යාවකින්)<br>• බෙදීම (පූර්ණ සංඛ්‍යාවකින්) | • ධාරිතාව හැඳින්වීම<br>• පරිමාව හා ධාරිතාව අතර සම්බන්ධය<br>• ධාරිතාව නිමානය<br>• ධාරිතාව ආශ්‍රිත ගැටලු | • නිශ්චිත පරිමාවක් සහිත ඝනකාභ සඳහා විවිධ දිග, පළල හා උස මිනුම් ප්‍රකාශ කරයි.<br>• ඝනකයක හෝ ඝනකාභයක පරිමාව නිමානය කරයි.<br>• ඝනක, ඝනකාභ, ඝනක සහ ඝනකාභවල පරිමා අතර සම්බන්ධතා හඳුනා ගනියි.<br>• පැත්තක දිග $a$ වූ ඝනකයක පරිමාව $a^3$ මඟින් ලබාගත හැකි බව ප්‍රකාශ කරයි.<br>• සූත්‍රය ඇසුරෙන් ඝනකයක පරිමාව ගණනය කරයි.<br>• ඝනකයක පරිමාව ආශ්‍රිත ගැටලු විසඳයි.<br>• දිග , පළල හා උස පිළිවෙළින් $a, b$ හා $c$ වූ ඝනකාභයක පරිමාව, $abc$ මඟින් ලබා ගත හැකි බව ප්‍රකාශ කරයි.<br>• සූත්‍රය ඇසුරෙන් ඝනකාභයක පරිමාව ගණනය කරයි.<br>• ඝනකාභයක පරිමාව ආශ්‍රිත ගැටලු විසඳයි.<br>• ඝනකයක හා ඝනකාභයක පරිමාව ආශ්‍රිත ගැටලු විසඳයි.<br>• ml හා l වලින් ප්‍රකාශිත ද්‍රව පරිමා පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කරයි. | පරිමාව කොටස එකට කරන්න.) |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • ml හා l වලින් ප්‍රකාශිත ද්‍රව පරිමා පූර්ණ සංඛ්‍යාවකින් බෙදයි.<br>• ද්‍රව පරිමා ගුණ කිරීම හා බෙදීම ආශ්‍රිත ගැටලු විසඳයි.<br>• භාජනයක් සම්පූර්ණයෙන් පිරවීමට අවශ්‍ය ද්‍රව ප්‍රමාණය, එම භාජනයේ ධාරිතාව ලෙස හඳුනා ගනියි.<br>• භාජනයක ඇති ද්‍රව ප්‍රමාණය, එහි ද්‍රව පරිමාව ලෙස හඳුනා ගනියි.<br>• ධාරිතාව යනු සම්පූර්ණ භාජනය සැලකීමෙන් ලබාගත් පරිමාවක් ම බව ප්‍රකාශ කරයි.<br>• භාජනයක ධාරිතාව නිමානය කරයි.<br>• පරිමාව හා ධාරිතාව ආශ්‍රිත ගැටලු විසඳයි. | |
| 23. වෘත්තය<br>(කවකටුව භාවිතයෙන් මෝස්තර ඇඳීම ඉවත් කර ඇත. සිසුන්ට ගෙදර වැඩ ලෙස පැවරිය හැකිය.) | • වෘත්තය<br>  • වෘත්ත ඇඳීම<br>• කවකටුව භාවිතයෙන්<br>  • කේන්ද්‍රය<br>  • අරය<br>  • විෂ්කම්භය | • වෘත්තය<br>  • ජ්‍යාය<br>  • කේන්ද්‍රික ඛණ්ඩය<br>  • වෘත්ත ඛණ්ඩය<br>  • සමමිතිකත්වය | • කවකටුව නිවැරදි ව හසුරුවමින් වෘත්ත අඳියි.<br>• වෘත්තයක හරි මැද පිහිටි ලක්ෂ්‍යය එහි කේන්ද්‍රය ලෙස හඳුනාගනියි.<br>• වෘත්තයක කේන්ද්‍රය හා වෘත්තය මත පිහිටි ලක්ෂ්‍යයක් යාකරන රේඛා ඛණ්ඩය, එම වෘත්තයේ අරය ලෙස හඳුනාගනියි. | 03 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • කේන්ද්‍රය හරහා ගමන් කරන පරිදි වෘත්තය මත පිහිටි ලක්ෂ්‍ය දෙකක් යා කරන සරල රේඛා කණ්ඩය, එම වෘත්තයේ විෂ්කම්භය ලෙස හඳුනාගනියි.<br>• වෘත්තයක විෂ්කම්භය එහි අරය මෙන් දෙගුණයක් බව භාවිත කරමින් සරල ගණනය කිරීම්වල යෙදෙයි.<br>• දෙන ලද අරයක් සහිත වෘත්ත, කවකටුව භාවිතයෙන් අඳියි.<br>• වෘත්තයක් මත ලකුණු කරන ලද ඕනෑ ම ලක්ෂ්‍ය දෙකක් යා කරන සරල රේඛාව ජ්‍යායක් ලෙස හඳුනාගනියි.<br>• වෘත්තයක් මත ලකුණු කරන ලද ලක්ෂ්‍ය දෙකක් අතර පිහිටි වෘත්තයේ කොටස, වෘත්ත චාපයක් ලෙස හඳුනාගනියි.<br>• වෘත්තයක අර දෙකකින් හා අදාළ චාප කොටසෙන් වට වූ ප්‍රදේශය, කේන්ද්‍රික ඛණ්ඩයක් ලෙස හඳුනාගනියි.<br>• වෘත්තයක චාප කොටසකින් සහ එම චාපයේ අන්ත දෙක යා කිරීමෙන් ලැබෙන ජ්‍යායෙනුත් වට වන ප්‍රදේශය, වෘත්ත ඛණ්ඩය ලෙස හඳුනාගනියි. | |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • වෘත්තයක සමමිති අක්ෂය, විශ්කම්භය බවත් වෘත්තයකට සමමිති අක්ෂ අපරිමිත සංඛ්‍යාවක් ඇති බවත් හඳුනාගනියි. | |
| 24. ස්ථානයක පිහිටීම | මෙම පාඩම ඉවත් කර ඇත. | | | |
| 25. සංඛ්‍යා රේඛාව හා කාටීසීය තලය | • කාටීසීය තලය<br>• පටිපාටිගත යුගල (පළමුවන වෘත්ත පාදකය පමණි)<br>• ලක්ෂ්‍ය ලකුණු කිරීම | • සංඛ්‍යා රේඛාව මත ලක්ෂ්‍ය නිරූපණය<br>• භාග<br>• දශම (දශමස්ථාන එකක් සහිත)<br>• භාග හා දශම සැසඳීම<br>• සංඛ්‍යා රේඛාව මත ප්‍රාන්තර නිරූපණය<br>• $x > a, x < a$<br>• $x \geq a, x \leq a$<br>• $a \leq x \leq b$ ආකාරයේ සංවෘත හා විවෘත ප්‍රාන්තර<br>• කාටීසීයතලය මත නිරූපණ | • වස්තුවක පිහිටීම දැක්වීමට සම්මත ක්‍රමයක් අවශ්‍ය බව පිළිගනියි.<br>• කාටීසීය ඛණ්ඩාංක තලය හඳුනා ගනියි.<br>• කාටීසීය ඛණ්ඩාංක තලයක පළමුවන වෘත්ත පාදකයේ පිහිටි ලක්ෂ්‍යයක ඛණ්ඩාංක, පටිපාටිගත යුගලයක් ලෙස විස්තර කරයි.<br>• කාටීසීය ඛණ්ඩාංක තලයක පළමුවන වෘත්ත පාදකයේ පිහිටි ලක්ෂ්‍යයක ඛණ්ඩාංක ලියා දක්වයි.<br>• $x, y \geq 0$ වන $(x, y)$ ඛණ්ඩාංක මගින් දැක්වෙන ලක්ෂ්‍ය, ඛණ්ඩාංක තලය මත ලකුණු කරයි.<br>• එදිනෙදා කටයුතුවල දී ඛණ්ඩාංක තලය පිළිබඳ දැනුම භාවිත කරමින් යම් වස්තුවක පිහිටීම නිර්ණය කරයි.<br>• සංඛ්‍යා රේඛාවක් මත භාග නිරූපණය කරයි. | 06 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | • නිඛිලමය පටිපාටිගත යුගල (වෘත්ත පාදක හතරම)<br>• $x = a, y = b$ ආකාරයේ ප්‍රස්තාර | • සංඛ්‍යා රේඛාවක් මත එක් දශමස්ථානයක් සහිත දශම සංඛ්‍යා නිරූපණය කරයි<br>• සංඛ්‍යා රේඛාව භාවිතයෙන් භාග හා දශම සසඳයි.<br>• $x > a$ හා $x < a$ ආකාරයේ අසමානතා සංඛ්‍යා රේඛාව මත නිරූපණය කරයි.<br>• $x \geq a$ හා $x \leq a$ ආකාරයේ අසමානතා සංඛ්‍යා රේඛාව මත නිරූපණය කරයි.<br>• $a \leq x \leq b, a \leq x < b, a < x \leq b, a < x < b, x \leq a$ හෝ $x > b, x \leq a$ හෝ $x \geq b$ ආකාරයේ අසමානතා සංඛ්‍යා රේඛාව මත නිරූපණය කරයි.<br>• සංඛ්‍යා රේඛාවක් මත නිරූපණය කර ඇති අසමානතා වීජීය ලෙස ලියා දක්වයි<br>• වෘත්ත පාදක හතරම ඇතුළත් වන පරිදි වූ කාටිසීය ඛණ්ඩාංක තලය අඳියි.<br>• $x, y \in \mathbb{Z}$ වූ $(x, y)$ ලක්ෂ්‍ය, ඛණ්ඩාංක තලය මත ලකුණු කරයි.<br>• ඛණ්ඩාංක තලය මත ලකුණු කර ඇති ලක්ෂ්‍යයක්, පටිපාටිගත යුගලයක් ලෙස ලියයි.<br>• $a, b \in Z$ වන පරිදි වූ $x = a, y = b$ ආකාරයේ ප්‍රස්තාර ඛණ්ඩාංක තලය මත අඳියි. | |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • $x$ අක්ෂයට හෝ $y$ අක්ෂයට සමාන්තර වූ සරළ රේඛාවක සමීකරණය $x = a$ හෝ $y = b$ හෝ ලෙස ලියයි. | |
| 26. ත්‍රිකෝණ නිර්මාණය | 10 ශ්‍රේණියේ පථ හා නිර්මාණ පාඩම යටතේ ත්‍රිකෝණ නිර්මාණය සමග සම්බන්ධ කර ඇත. | | | |
| 27. දත්ත නිරූපණය හා අර්ථකථනය<br>(8 ශ්‍රේණියේ වෘත්ත පත්‍ර සටහන ඉවත් කර ඇත.) | • දත්ත නිරූපණය<br>  • ප්‍රස්තාර<br>    • තීර<br>    • බහුතීර (ප්‍රවර්ග තුනකට නොවැඩි)<br>• දත්ත අර්ථකථනය<br>  • තීර ප්‍රස්තාර මගින්<br>  • බහුතීර ප්‍රස්තාර මගින් | • කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් (අමු දත්ත වැලක)<br>  • මාතය<br>  • මධ්‍යස්ථය<br>  • මධ්‍යන්‍යය<br>• විසිරීම පිළිබඳ මිනුම් (අමුදත්ත වැලක)<br>  • පරාසය | • සමාන පළලකින් යුත් තීර යොදා ගනිමින්, තීර ප්‍රස්තාර අඳින බව ප්‍රකාශ කරයි.<br>• තිරස් හෝ සිරස් ලෙස තීර යොදා ගනිමින් තීර ප්‍රස්තාර ඇඳිය හැකි බව ප්‍රකාශ කරයි.<br>• තීරයේ දිග මගින් එම තීරයට අනුරූප දත්ත සංඛ්‍යාව නිරූපණය කරන බව ප්‍රකාශ කරයි.<br>• දෙන ලද දත්ත සමූහයක් තීර ප්‍රස්තාරයක් මගින් නිරූපණය කරයි.<br>• ප්‍රවර්ග තුනකට නොවැඩි දත්ත සමූහ එකම ප්‍රස්තාරයක දක්වා ඇති අවස්ථා සඳහා නිදසුන් සපයයි.<br>• බහුතීර ප්‍රස්තාර මගින් දත්ත නිරූපණය කිරීමේ දී අදාළ අවස්ථා සඳහා අඳින ප්‍රවර්ගවල තීර එකිනෙකට යාබද ව අඳින බව ප්‍රකාශ කරයි. | 06 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • ප්‍රවර්ග තුනකට නොවැඩි ව දෙන ලද දත්ත සමූහ බහු තිර ප්‍රස්තාරයක් මගින් නිරූපණය කරයි.<br>• තීර හෝ බහුතීර ප්‍රස්තාර අතුරින් සුදුසු ක්‍රමය තෝරා ගනිමින් දත්ත ප්‍රස්තාරික ව නිරූපණය කරයි.<br>• තීර හෝ බහුතීර ප්‍රස්තාර අතුරින් දත්ත නිරූපණය කිරීමට යොදාගත් ක්‍රමයේ යෝග්‍යතාව තහවුරු කරයි.<br>• තීරවල දිග සැසඳීමෙන් වැඩි ම අගය සහ එම අවස්ථාව සොයයි.<br>• තීරවල දිග සැසඳීමෙන් අඩු ම අගය සහ එම අවස්ථාව සොයයි.<br>• තීරවල දිග සැසඳීමෙන් සමාන අගයයන් ඇති අවස්ථා සොයයි.<br>• තීරවල දිග ඇසුරින් තොරතුරු සන්සන්දනය කරයි.<br>• තීර ප්‍රස්තාර සහ බහු තීර ප්‍රස්තාර මගින් තොරතුරු සංජානනය කාර්යක්ෂම කරන බව හඳුනා ගනියි.<br>• අමු දත්ත වැලක මාතය සොයයි.<br>• අමු දත්ත වැලක මධ්‍යස්ථය සොයයි. | |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • දත්ත තිහකට නොවැඩි දත්ත වැලක මධ්‍යන්‍යය ගණනය කරයි.<br>• අමු දත්ත වැලක මාතය, මධ්‍යස්ථය හා මධ්‍යන්‍යය ඇසුරින් තීරණවලට එළඹෙයි.<br>• අමු දත්ත වැලක පරාසය සොයයි. | |
| 28. පරිමාණ රූප | 9 ශ්‍රේණියේ පරිමාණ රූප පාඩම සමග සම්බන්ධ කර ඇත. | | | |
| 29. සම්භාවිතාව | • සිදුවීමක විය හැකියාව<br>  • ස්ථිර ව සිදුවන සිදුවීම්<br>  • ස්ථිරව සිදුනොවන සිදුවීම්<br>  • සිදුවන හෝ සිදුනොවන බව ප්‍රකාශ කළ නොහැකි සිදුවීම්<br>• පරීක්ෂණ<br>  • නැඹුරු<br>  • නොනැඹුරු | • සම්භාවිතාව<br>  • 0-1 පරිමාණය<br>• සිද්ධියක විය හැකියාව සඳහා සුදුසු අගයන්<br>  • සාර්ථක භාගය<br>  • පරීක්ෂණාත්මක සම්භාවිතාව<br>  • සෛද්ධාන්තික සම්භාවිතාව | • ස්ථිර ව ම සිදුවන බව දන්නා සිදුවීම්, ස්ථිර ව සිදුවන සිදුවීම් ලෙස ප්‍රකාශ කරයි.<br>• ස්ථිර ව ම සිදුනොවන බව දන්නා සිදුවීම්, ස්ථිර වසිදුනොවන සිදුවීම් ලෙස ප්‍රකාශ කරයි.<br>• සිදුවන බව හෝ සිදුනොවන බව ස්ථිර ව ම ප්‍රකාශ කළ නොහැකි සිදුවීම්, සිදුවන හෝ සිදුනොවන බව ප්‍රකාශ කළ නොහැකි සිදුවීම් ලෙස ප්‍රකාශ කරයි.<br>• දෙන ලද සිද්ධි, ස්ථිරව සිදුවන සිදුවීම්, ස්ථිර ව සිදුනොවන සිදුවීම් හා සිදුවන හෝ සිදුනොවන බව ප්‍රකාශ කළ නොහැකි සිදුවීම් ලෙස කාණ්ඩ කරයි.<br>• පරීක්ෂණයක දී ලැබිය හැකි ප්‍රතිඵල විස්තර කරයි. | 03 |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • පරීක්ෂණයේ සියලු ම ප්‍රතිඵල ලැබීමට සමාන හැකියාවක් ඇති පරීක්ෂණ සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>• පරීක්ෂණයේ සියලු ම ප්‍රතිඵල ලැබීමට සමාන හැකියාවක් නොමැති පරීක්ෂණ සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>• සියලු ම ප්‍රතිඵල ලැබීමට සමාන හැකියාවක් ඇති පරීක්ෂණවලදී භාවිත කරනු ලබන වස්තු නොනැඹුරු බව ප්‍රකාශ කරයි.<br>• සියලු ම ප්‍රතිඵල ලැබීමට සමාන හැකියාවක් නොමැති පරීක්ෂණවලදී භාවිත කරනු ලබන වස්තු නැඹුරු බව ප්‍රකාශ කරයි.<br>• දෙන ලද පරීක්ෂණ අතුරින් නොනැඹුරු වස්තු හා නැඹුරු වස්තු භාවිත කරනු ලබන පරීක්ෂණ වෙන් කොට දක්වයි.<br>• ස්ථිර ව ම සිදු වන සිද්ධියක විය හැකියාවට ප්‍රදානය කරනු ලබන ලකුණ 1 බව ප්‍රකාශ කරයි.<br>• ස්ථිර ව ම සිදු නොවන සිද්ධියක විය හැකියාවට ප්‍රදානය කරනු ලබන ලකුණ 0 බව ප්‍රකාශ කරයි.<br>• සිදු වීම නිශ්චිත නොවන සිද්ධියක වියහැකියාවට ප්‍රදානය කරනු ලබන ලකුණ 0ත් 1ත් අතර බව ප්‍රකාශ කරයි. | |

| පාඩම | 7 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | 8 ශ්‍රේණිය විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | යෝජිත කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • සමාන විය හැකියාවකින් යුත් ප්‍රතිඵල දෙකක් පමණක් ඇති පරීක්ෂණයක එක් ප්‍රතිඵලයක් සිදුවීමේ විය හැකියාවට ප්‍රදානය කරනු ලබන ලකුණ $\frac{1}{2}$ බව ප්‍රකාශ කරයි.<br>• යම් සිද්ධියක් සිදු වීමේ හැකියාව, ඉතා වැඩි නම් ඊට ප්‍රදානය කරනු ලබන ලකුණ $\frac{1}{2}$ත් 1ත් අතර බවත්, ඉතා අඩු නම් ඊට ප්‍රදානය කරනු ලබන ලකුණ 0ත් $\frac{1}{2}$ත් අතර බවත් ප්‍රකාශ කරයි. | |
| 30. ටෙසලාකරණය | මෙම පාඩම ඉවත් කර ඇත. | | | |
| | | | **එකතුව** | **100** |